සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

# ඉස්ලාම් ධර්මය

**6 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

**නම/ විභාග අංකයः**

## I - කොටස

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 සලාතයෙහි ෂර්ත් වලින් එකක්,

(i) නියියත් (ii) අව්රතය වැසීම (iii) රුකූඋ සුජූදු කිරීම (iv) හිස ආවරණය කිරීම

02 ලෞකික ජීවිතය තුළම දඬුවම් දිය යුතුයි යනුවෙන් දෙවියන් අණ කළ බව මුහම්මද් නබි (සල්) තුමාණන් පැවසූ දඬුවම කුමක්ද?

(i) සලාතය අතහැරීම. (ii) අපවාද.

(iii) මුසාවාදය. (iv) දෙමාපියන්ට වේදනා දීම.

03 "ජාහිලියියා" යන පදයෙහි තේරුම,

(i) දැනුම (ii) නොදැනුවත්කම (iii) කුසල් (iv) අකුසල්

04 උපවාසයෙහි ෆර්ල්,

(i) 2 (ii) 6 (iii) 4 (iv) 19

05 අල් කුර්ආනය නබි (සල්) තුමාණන් වෙත අවුරුදු කීයක් පහළ වූයේද?

(i) 13 (ii) 11 (iii) 23 (iv) 15

06 "තක්වා" යන පදයෙහි තේරුම,

(i) පව් ක්ෂමාව. (ii) දේව බිය බැතිකම. (iii) දයාව. (iv) මස්ජිදයෙහි රැඳීම.

07 අල් කුර්ආනයෙහි ඇති පරිච්ඡේද ගණන,

(i) 6666 (ii) 30 (iii) 7 (iv) 114

08 මුලින්ම පහළ කරන ලද සූරාව,

(i) සූරතුල් ෆලක්. (ii) සූරතුල් ෆාතිහා.

(iii) සූරතුල් අලක්. (iv) සූරතුල් ඉඛ්ලාස්.

09 මක්කා දේශයෙන් මදීනා දේශයට ගිය නබි මිතුරන් උදව් උපකාර කල මදීනා වැසියන්ව කෙසේනම් ආමන්ත්‍රණය කරන්නෙමු ද?

(i) අන්සාරිවරුන් (ii) සහාබාවරුන් (iii) මුහාජිරිවරුන් (iv) මුඃමින්වරුන්

10 කාගේ තෘප්තියෙහි ද අල්ලාහ්ගේ තෘප්තිය ඇති බව හදීසයෙහි සඳහන් වන්නේ,

(i) දෙමාපියන් (ii) ගුරුවරුන් (iii) ළමුන් (iv) වැඩිහිටියන්

11 සාමාන්‍ය නජීසයට උදාහරණ,

(i) සුනඛ කෙළ

(ii) දහඩිය

(iii) වයස අවුරුදු දෙකක් ඇති මව්කිරි බොන පිරිමි ළදරුවාගේ මුත්‍රා

(iv) ලේ

12 සූර් පිඹීමට බාරකාර මලාඉකවරයා,

(i) ඉස්මාඊල් (අලෛ) (ii) ඉස්රාෆීල් (අලෛ)

(iii) ජිබ්රීල් (අලෛ) (iv) රකීබ් (අලෛ)

13 මලාඉකාවරුන් නිර්මාණය කරන ලද්දේ,

(i) ආලෝකයෙන් (ii) පස් (iii) ගින්දර (iv) ජලය

14 වුළූහි ෆර්ල් වලින් එකකි,

(i) මුඛ සේදීම. (ii) කන් දෙක මසහ් කිරීම.

(iii) දකුණට ප්‍රමුකත්වය දීම. (iv) හිස අවරණය කිරීම.

15 අල් කුර්ආනයෙහි තුනෙන් එක් කොටසකට සමාන යැයි නබි තුමා විසින් වර්ණනා කරන ලද සූරාව,

(i) සූරතුල් අලක් (ii) සූරතුන් නාස් (iii) සූරතුල් ෆලක් (iv) සූරතුල් ඉඛ්ලාස්

- **පහත සඳහන් කියමන් නිවැරදි නම් (✓) සලකුණ ද, වැරදි නම් වැරදි (✗) සලකුණ ද යොදන්න.**

16 නජීස් කොටස් දෙකක් වේ. ( )

17 කෙනෙකුගේ නැති දෙයක් පැවසීම කේලම් නම් වේ. ( )

18 සභාවකට යන විට සලාම් කිව යුතුය. ( )

19 අල්කුර්ආනය මන්සිල් 7 කට බෙදා ඇත. ( )

20 දේව ග්‍රන්ථ විශ්වාස කිරීම ඊමානයෙහි 4 වන අංගය වේ. ( )

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වන අතර තවත් ප්‍රශ්න ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

01 කෙටි පිළිතුරු සපයන්න.

(i) 'සව්ම්' හි ෆර්ල් සඳහන් කරන්න.

(ii) "සූරා ඉඛ්ලාස්" හි තවත් නමක් සඳහන් කරන්න.

(iii) රාමළාන් මාසයෙහි වැදගත් වූ රාත්‍රිය කුමක් ද?

(iv) මුලින්ම අල් කුර්ආණය ග්‍රන්ථාරූඪ කළේ කාගේ කාලයේදී ද?

(v) අවසන් ආගම කුමක්ද?

(vi) දිවෙන් සිදුවන අකුසල් දෙකක් ලියන්න.

(vii) "කේලාම්" යනු කුමක් ද?

(viii) "මුතබයිහිකුන්" යන්නෝ කවුරුන් ද?

(ix) ෆර්ල් සව්ම් කුමන මාසයේද ඉටුකරනු ලබන්නේ

(x) කබ්ර්හි ප්‍රශ්න කරන මලාඉකාවරුන් දෙදෙනා කවුරුන් ද? (2 x10 = 20)

02 (i) ලෙයිලතුල් කදර් රාත්‍රියෙහි විශේෂත්වයන් දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) සව්මයේ ප්‍රයෝජන තුන ලියන්න. (ලකුණු 03)

(iii) සව්ම් කාලයෙහි කලයුතු යහපත් ක්‍රියාවන් 5ක් ලියන්න. (ලකුණු 05) (ලකුණු 10)

03 (i) මිනිසාගේ අවයව වලින් දිනපතා බියවිය යුත්තේ කුමන අවයවයට ද? (ලකුණු 02)

(ii) නජීස් හි වර්ග සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) සලාතයෙහි වාචික සුන්නතයන්හි 05 දෙන්න. (ලකුණු 05) (ලකුණු 10)

04 (i) අධ්‍යාපනය ලබන්නන්හට ප්‍රාර්ථනා කරන පාර්ශවයන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) අන් අයට උදව් කිරීමේ, වැඩ කිරීමේ වැදගත්කම සඳහන් කරරන හදිසයක් ලියන්න. (ලකුණු 03)

(iii) අන් අයට උදව් කිරිම සම්බන්ධව පාඩම් පොතෙහි ඇතුලත් වි ඇති සිදුවීම් අතරින් එකක් ගැන කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(ලකුණු 10)

05 (i) සූරතුල් ඉඛ්ලාස් කීවන පරිච්ඡේදයද ? (ලකුණු 02)

(ii) සූරා ඉඛ්ලාසය සිංහලෙන් / අරාබියෙන් ලියා එහි අර්ථයද ලියන්න. (ලකුණු 08) (ලකුණු 10)

06 (i) ජින්වරුන් කුමකින් මවන ලද්දේද ? (ලකුණු 02)

(ii) අනුමැතිය ලබා ගැනීම සඳහා ක්‍රමවේදයන් 3ක් ලියන්න. (ලකුණු 03)

(iii) අල් කුර්ආනය පාරායනය කිරීමේදී පිළිපැදිය යුතු කරුණු 05 ක් ලියන්න. (ලකුණු 05) (ලකුණු 10)

07 (i) ඉස්ලාමීය වගකිම්වලින් ප්‍රථම වගකීම් දෙක ලියන්න. (ලකුණු 02)

(ii) විද්වතුන්ගේ වැදගත්කම් 3ක් ලියන්න. (ලකුණු 03)

(iii) දෙමාපියන්ට කළ යුතු (වගකීම්) යුතුකම් 5 ලියන්න. (ලකුණු 05) (ලකුණු 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| (01) 2 | (02) 4 | (03) 2 | (04) 1 | (05) 3 | (06) 2 | (07) 4 | (08) 3 | (09) 1 |
| (10) 1 | (11) 4 | (12) 2 | (13) 1 | (14) 4 | (15) ✓ | (16) ✗ | (17) ✗ | (18) ✓ |
| (19) ✓ | (20) ✗ | | | | | | | |

## II කොටස

01 (1) නියියත්
සහර් වේලාවේ සිට උපවාසයෙන් මිදෙන තෙක් සව්ම් බිඳවන කාර්යයන්වල නිරත නොවීම.
(2) i) සූරතුල් අහද් ii) සූරතුත් තව්හීද්
(3) ලෙයිලතුල් කද්ර්
(4) අබූබක්කර් (රළි)
(5) අල් කුර්ආන්
(6) කේලාම් කීම, අපවාද පැවසීම, නම් පටබැඳීම්, බොරු කීම්, නින්දා කිරීම්, නරක වචන භාවිත කිරීම
(7) වචනවලින් උඩඟුකම් පාන අය
(8) කෙනෙකු අකමැති දෙයක් ගැන සඳහන් කිරීම (මීට සමාන පිළිතුරු)
(9) රමළාන්
(10) මුන්කර් , නකීර්

02 (1) *මාස දාහකට වඩා වැදගත්ය * මලාඉකාවරුන් හා ජිබ්රීල් (අලෛ) භූමියට බැසීම
* අල් කුර්ආනය පහලකිරීම (ලකුණු 03)
(2) *දේව බිය බැතිකම ඇතිකිරීම * නිරෝගීකම * පරිත්‍යාගශීලීත්වය * සංවරය / හික්මීම
* ඉවසීම. අමාරුකම් ඉවසීම, අඩු වියදම (සරල වියදම) වේදනා හඳුනා ගැනීම, යන ගුණාංගයන් වර්ධනය කිරීම
* පව් ක්ෂමා කිරීම * අධික කුසල් ලැබීම * ප්‍රාර්ථනා ඉටුවීම (ලකුණු 03)
(3) *සහර් කිරීම * අධිකව (දුආ) ප්‍රාර්ථනා කිරීම * තහජ්ජත් * තරාවිහ් කියාමුල්ලෙයිල් * 'ඉෆ්තාර්' සංවිධානය කිරීම * 'සදකා' කිරීම *අල් කුර්ආනය වැඩි වරුනයෙන් පාරායනය කිරීම * ඉස්තිග්ෆාර් කිරීම / පව්ක්ෂමා කිරීම (ලකුණු 05)

03 (1) දිව
(2) දැඩි නජීස් , සාමාන්‍ය නජීස්, සැහැල්ලු නජීස්
(3) *දුආඋල් ඉස්තිප්තාහ් *සූරා පාරායනය කිරීමේදී (අඋඅදුබිල්ලහ්) පැවසීම *සූරාතුල් ෆාතිහා පාරායනය අවසානයේදී ආමීන් පැවසීම *මුල් රක්අත් දෙකෙහිම සූරා ෆාතිහා පාරායනයෙන් පසු වෙනත් සූරා වගන්ති කිහිපයක් පාරායනය කිරීම *රුකූඋ කිරීමේදී "සුබ්හාන රබ්බියල් අළීම්" ලෙස තස්බීහ් පැවසිම *ඉෑතිදාවෙහි දෙවියන්ව ප්‍රශංසා කිරීම *සුජුද්හිදී "සුබ්හාන රබ්බියල් අෑලා පැවසිම *මැද ඉඳමෙහි " රබ්බිග්ෆිර්ලී" යන දුආ පැවසිම *දෙවන සලාමමය පැවසීම (ලකුණු 05)
(4) * ජලයෙහි ජීවත් වන මාළු * පසෙහි ජීවත්වන ජීවින් * පක්ෂීන් / කුහුඹුවන් (ලකුණු 02)
(2) *" එක් ගැත්තකු තවත් ගැත්තකුට උදව් කරමින් සිටින මොහොත පුරාම එම ගැත්තාට අල්ලාහ් උදව්කරමින් සිටින්නේය (මුස්ලිම්) (ලකුණු 03)
* "ඔබගෙන් කෙනෙකු තමන් කැමති දෑ තම සහෝදරයාට අකමැති නොවන තාක්කල් ඔහු සත්‍ය විශ්වාසවන්තයකු වන්නේ නැහැ"
*" මිනිසුන්ට ආදරය නොදක්වන අය වෙනුවෙන් අල්ලාහ් ආදරය දක්වන්නේ නැහැ"
(3) *ලාම්පුව නිවා ආගන්තුක සත්කාර කල සිදුවීම
* "යර්මුක්" යුද්ධයේදී මරණාසන්න මොහොතේ අනෙක් කෙනාට ජලය ලබා දීමේ සිදුවීම
* මුහාජිර්වරුන්ව අන්සාරිවරුන් උදව් උපකාර කල අයුරු හුවා දක්වන කිසියම් සිදුවීම කෙටියෙන් පැහැදිලි කර තිබීම (ලකුණු 05)

(5) (1) 112
(2) සූරා ඉහ්ලාස් සිංහලෙන්/ අරාබියෙන් ලියා තේරුමද ලියා ඇත්නම් (ලකුණු 08)

(6) (1) ගින්දර මගින්
(2) *සලාම් පැවසීම * 3න් වතාවක් පමන අනුමැත්ය ඉල්ලීම * ගෙතුළ එබිකම් නොකිරිම (ලකුණු 03)
(3) * වුළුඃ කිරිම * ශරීරය, ඇඳුම් පිරිසිදුව තබා ගැනිම * " අඋඅදු" පවසා ආරම්භ කිරීම * ඒ සමඟ " බිස්මිල්" පැවසීම * "තජ්වීද්" අනුගමනය කර පාරායනය කිරීම * සජදා වගන්ති පාරායනා කිරීමේදී සජදා තිලාවත් කිරීම * අන් අයට කරදරයක් නොවී පාරායනය කිරීම * වැසිකිළි වැනි තහනම් ස්ථානවල, කන්තත (මකබරා) වැනි ස්ථානවල පාරායනය නොකිරීම * නජීස් ස්ථිනවලට ගෙනයෑමෙන් වැළකී සිටිම * අල්කුර්ආන් පාරායනය කරන විට නිශ්ශබ්දව සවන් දීම (ලකුණු 05)

(7) (1) * කලිමා * සලාතය (ලකුණු 02)
(2) නබිතුමාණන්ගේ උරුමක්කාරයින් * මලාඉකවරුන්, මලාඉකවරුන්ගේ ෂෆාඅත් වලට හිමි අය * අල්ලාහ්ගේ දයාව ලැබූ අය (ලකුණු 03)
(3) *ස්තුති ප්‍රණාමය *ප්‍රාර්ථනා කිරීම *සංවරව කතා කිරීම, ඔහුන්ගේ කිම අනුව ක්‍රියා කිරීම
* ආදරයෙන් හා කරුණාවෙන් සිටීම
* ඔවුන්ගේ අනුමැතිය ලැබ කාර්යවල නිරත වීම
* දෙමාපියන් , යහළුවන්, නෑදෑයන් ගරු කිරීම (ලකුණු 03)